		රාජ්‍ය ආයතන විශේෂ ආයතන හා සංවර්ධන ව්‍යාපෘති	254.13	254.13	205.54	81%
		ජාතික ප්‍රමුඛතාවයන් සඳහා ජාතික මට්ටමේ මගපෙන්වීම හා සම්බන්ධීකරණය	1,322,143.64	1,322,143.64	983,024.57	74%
02	මැතිවරණ කොමිෂන් සභාව	සාමාන්‍ය පරිපාලනය සහ ආයතනික සේවා	17,069.34	17,069.34	17,067.83	100%
03	බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	සංස්කෘතික හා ජාතික උරුම සංවර්ධනය	9,983.90	9,983.90	9,652.31	97%
		ආගමික කටයුතු නගා සිටුවීම	7,908.67	7,908.67	7,875.27	100%
04	මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	සුබසාධන වැඩසටහන්	2,953,575.25	2,953,575.25	2,840,506.16	96%
05	ආරක්ෂක අමාත්‍යාංශය	පරිපාලන සහ ආයතනික සේවා	53.54	53.54	50.33	94%
		ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය	7,110.72	7,110.72	7,046.45	99%
		ආපදා සහන මෙහෙයුම්	107,847.45	107,847.45	104,683.51	97%

06	අධිකරණ බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා	2,153.30	2,153.30	2,119.31	98%
		සමථ මණ්ඩල පනත ක්‍රියාත්මක කිරීම	20,173.00	20,173.00	17,178.60	85%
		ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධනය	17,133.94	17,133.94	16,159.46	94%
07	සෞඛ්‍ය අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා (දේශීය වෛද්‍ය අංශය)	22,500.94	22,500.94	22,334.87	83%
		බෝවන රෝග සහ බෝ නොවන රෝග වැලැක්වීම සහ පාලනය කිරීම	16,995.21	16,995.21	14,118.01	100%
08	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	නව දුම්රිය මාර්ග සංවර්ධනය කිරීම	806.00	806.00	805.99	100%
		මාර්ග සංවර්ධනය	162,392.72	162,392.72	144,812.59	89%
09	කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා	68,413.27	68,413.27	64,650.74	95%
		කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන	49,790.64	49,790.64	22,798.60	46%
10	සංචාරක හා ඉඩම් අමාත්‍යාංය	පරිපාලන හා ආයතනික සේවා	28,891.71	28,891.71	27,194.60	94%
		ඉඩම් සංවර්ධනය සහ ඉඩම් අත්පත්කර ගැනීම	17,255.12	17,255.12	16,918.76	98%
		සංචාරක අංශයේ සංවර්ධනය	37,553.29	37,553.29	5,845.83	16%
11	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	නිවාස සංවර්ධනය	300,000.00	300,000.00	282,564.19	94%
12	අධ්‍යාපන අමාත්‍යාංශය	පරිපාලන සහ ආයතනික සේවා (නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපන)	1,491.30	1,491.30	1,354.30	91%

		විශේෂ අධ්‍යාපනය	7,510. 00	7,510. 00	7,490.69	100%
13	රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා(රාජ්‍ය භාෂා)	472.24	472.24	429.84	91%
		ස්වදේශ කටයුතු	20,584.19	20,584.19	19,887.02	97%
		පරිපාලන හා ආයතනික සේවා(රාජ්‍ය පරිපාලන)	176,211.99	176,211.99	167,425.54	95%
14	කර්මාණ්ත අමාත්‍යාංශය	විදාතා වැඩසටහන	8,363.96	8,363.96	7,800.51	93%
		කර්මාණ්ත සංවර්ධන වැඩසටහන්	330.46	330.46	330.46	100%
15	පරිසර අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා	22,164.99	22,164.99	21,695.05	98%
		පරිසර සංරක්ෂණය	270.00	270.00	268.54	99%
16	කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය	කාන්තා සංවර්ධනය	3,815.35	3,815.35	3,412.72	89%
		සමාජ සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම	53,838.42	53,838.42	51,989.81	97%
		ළමා සංවර්ධනය	744,732.90	744,732.90	700,004.96	94%
17	ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය	අපනයන සංවර්ධන ඒකකය	22,696.01	22,696.01	22,603.84	100%
18	මහජන ආරක්ෂක අමාත්‍යාංශය	සාමාන්‍ය පරිපාලනය සහ ආයතනික සේවා	3,322.37	3,322.37	2,914.38	88%
19	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	පරිපාලන හා ආයතනික සේවා(විදේශ රැකියා)	3,526.70	3,526.70	3,276.87	93%
		ජාතික ඵලදායිතා මහලේකම් කාර්යාලය සහ ඵලදායිතා ප්‍රවර්ධනය	2,062.98	2,062.98	1,980.03	96%
20	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය	පරිපාලන සහ ආයතනික සේවා(ක්‍රීඩා)	50,359.89	50,359.89	44,703.30	89%
		තරුණ සංවර්ධනය	19,945.68	19,945.68	18,144.70	91%
21	වාරිමාර්ග අමාත්‍යාංශය	වාරිමාර්ග සංවර්ධන	5,619.55	5,619.55	4,607.46	82%

		වැඩසටහන				
22	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	සාමාන්‍ය පරිපාලනය	348.80	348.800	339.21	97%
		බෞද්ධ ආගමික කටයුතු ප්‍රවර්ධනය	62,914.97	62,914.97	60,779.35	97%
23	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු වර්ධනය කිරීම	46.55	46.55	46.47	100%
24	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	ක්‍රිස්තියානි ආගමික හා සංස්කෘතික කටයුතු වර්ධනය කිරීම	621.07	621.07	556.07	90%
25	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	ප්‍රකාශණ හා සාහිත්‍ය කටයුතු	2,209.00	2,209.00	2,117.03	96%
		කලා හා කලා ශිල්ප වර්ධනය	5,057.00	5,057.00	5,001.69	99%
26	ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	ප්‍රවෘත්ති ප්‍රචාරය	544.49	544.49	523.96	96%
27	සමාජ සේවා දෙපාර්තමේන්තුව	සමාජ සේවාවන් සඳහා මුදල් ආධාර	56,552.78	56,552.78	51,648.82	91%
		පුනරුත්තාපන සහ පුහුණු කිරීම් සේවා	5,296.68	5,296.68	5,050.01	95%
28	පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව	පරිවාස හා ළමා රක්ෂක සේවා	6,511.10	6,511.10	6,395.07	98%
29	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	ක්‍රීඩා සංවර්ධනය	330.71	330.71	233.02	70%
30	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව	ආගමන පාලනය සහ පුරවැසිභාවය	20.70	20.70	20.70	100%
31	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	පුද්ගලයින් ලියාපදිංචි කිරීම හා ඊට අදාල කටයුතු	46,717.38	46,717.38	46,538.56	100%
32	සුරාබදු දෙපාර්තමේන්තුව	සුරාබදු ආඥා පනත හා දුම්කොළ බදු පරිපාලනය සහ මත්පැන් කර්මාණ්තය නියාමනය කිරීම	2,010.65	2,010.65	2,010.65	100%

33	ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව	ජාතික සංඛ්‍යාලේඛණ	79,562.18	79,562.18	70,835.01	89%
34	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම	610,062.03	610,062.03	585,961.33	96%
35	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා	1,604.97	1,604.97	1,176.08	73%
		ලියාපදිංචි කිරීමේ කටයුතු	3,340.62	3,340.62	2,936.07	88%
36	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	පරිපාලන හා ආයතනික සේවා	18,131.73	18,131.73	18,130.93	100%
37	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	අන්තර් පලාත් ඉඩම් සංවර්ධනය	19,987.93	19,987.93	18,828.67	94%
38	පේෂකර්මාණ්ත දෙපාර්තමේන්තුව	පරිපාලන හා ආයතනික සේවා	38,177.96	38,177.96	37,330.46	98%
39	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	මෝටර් රථ ප්‍රවාහන පනත ක්‍රියාත්මක කිරීම	4,025.10	4,025.10	3,554.77	88%
40	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව	උද්භිද උද්‍යාන සංවර්ධනය	13,700.00	13,700.00	11,894.66	87%
41	කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව	කළමණාකරණ විගණන පරිපාලනය	257.11	257.11	251.90	98%
42	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	පරිපාලන හා ආයතනික සේවා	2,550.00	2,550.00	2,339.08	92%
43	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	ඉඩම් පරිහරණ සැලසුම් හා ඉඩම් සංවර්ධන වැඩසටහන්	6,386.27	6,386.27	5,927.62	93%
44	මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව	පරිපාලන හා ආයතනික සේවා	2,314.77	2,314.77	2,228.27	96%
		මිනස් බල හා රැකී රක්ෂා සංවර්ධනය	879.26	879.26	870.61	99%
එකතුව			7,308,244.33	7,308,244.33	6,632,196.575	91%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය (000')

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		1,672,976.44		
9152	යන්ත්‍රෝපකරණ හා වාහන		698,622.21		
9153	ඉඩම්		2,450,224.49		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. NWCG/KR/A/DSK/2024/74 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2025 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
කුරුණෑගල.

ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්වාගණනය කළ මතය

ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්තිවය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනාවලින්, මූල්‍ය නත්තිවය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි

ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් විසින් 2021 මාර්තු 12 දින නිකුත් කර ඇති අංක DSKU/ACC/AC/ADACC/8 දරන ලිපිය පරිදි නිල නිවාස හා දීර්ඝ කාලීන බදු/කුලී ලෙස ලබා දී ඇති සියලු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් කඩිනමින් තක්සේරු කර 2021 මාර්තු 31 දිනට පෙර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතු වුවත්, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි රජයට අයත් ලෙස හඳුනාගත් ඉඩම් සහ ගොඩනැගිලි 28 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 තුළ පැවති රජයට අයත් දීර්ඝ කාලීන බදු/ කුලී ලෙස ලබාදී ඇති සියලු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිරිබාව, උඩුබද්දාව, යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වසර 10 කට වඩා අභාවිතව පවතින වටිනාකම තක්සේරු නොකල වාහන 02 ක් සිගාස් වැඩසටහන තුළ වත්කම් ලෙස සටහන් වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ විමධ්‍යගත අයවැය වැඩසටහන මඟින් වැය විෂය අංක 001-2-06-023 - 2509 යටතේ ලද ප්‍රතිපාදන වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක වැඩ නිමකල නිල සෙවන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවා තිබුණු රු.4,815,600 ක වටිනාකම ගිණුම්ගත නොවීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයේ අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ තක්සේරු කර කාර්යාල හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර ඇති මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ පිහිටි අබලන්ව පැවති නිල නිවස රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2023

වර්ෂයේ රු. 10,788,960 ක ප්‍රතිපාදන යටතේ අලුතින් ඉදිකර භාරදී තිබුණද, සමාලෝචිත වර්ෂයේ නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
2.1(ඊ)	ස්ථානමාරු පටිපාටිය ක්‍රියාත්මක කර නොකිබීම	3.3 (ඇ)
2.1(ඇ)	ග්‍රාම නිලධාරි කාර්යාල පරීක්ෂාව සිදුකර නොතිබීම	3.3 (ආ)
2.1(ආ)	කල් ඉකුත් වූ තැන්පත් රඳවා තබාගැනීම	3.4 (අ),(ආ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධි ඇස්තමේන්තු සැකසීම, ඇස්තමේන්තු සැකසීමේ දුර්වලතා හා චක්‍රලේඛ ප්‍රකාරව පුහුණු අවස්ථාවන් ලබා නොදීම හේතුවෙන් පහත සඳහන් වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන ඉතිරිවීම් සම්බන්ධව හේතු පැහැදිලි කිරීම් විගණනයේදී පිලිගත නොහැකි විය.

(i) ව්‍යාපෘති අංක 1,2,3 මඟින් වැය විෂයයන් 07 ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 11 ත් සියයට 77 ත් අතර පරාසයක එකතුව රු. 38,149,725 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබීම.

(ii) ව්‍යාපෘති අංක 1,2,3 මඟින් 1506 වැය විෂයය සඳහා වෙන් කර තිබුණු එකතුව රු.31,700,000 ක ප්‍රතිපාදන වලින් රු. 8,826,828 ක් හෙවත් සියයට 28 ක් ඉතිරි වී තිබීම.

(iii) ව්‍යාපෘති අංක 1,2,3 මඟින් 2401 වැය විෂයය සඳහා වෙන්කර තිබුණු එකතුව රු.3,900,000 ක ප්‍රතිපාදනයෙන් රු.2,631,200 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 67 ක් ඉතිරි වී තිබීම.

(iv) ව්‍යාපෘති අංක 2,3 මඟින් වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනයන්ගෙන් මූ.රෙ .66 යටතේ එකතුව රු.7,395,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබියදීත් සියයට 7 ත් සියයට 34 ත් අතර පරාසයක එකතුව රු.13,033,487 ක් වටිනා ප්‍රතිපාදන ඉතුරු වී තිබීම.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 (ii) හා (iii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත්, සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව සම්පාදන කිරීම ගණන් දීමේ නිලධාරින්ගේ වගකීම වුවත්, ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 09 ක එකතුව රු.22,395,000 ක ප්‍රතිපාදන අඩුකර වෙනත් වැය විෂයයන් 10 කට එම ප්‍රතිපාදන මාරුකර තිබුණි. එසේම වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිලියෙල නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 47 ක් සඳහා සලසා තිබුණු රු. 310,905,000 ක ප්‍රතිපාදනයෙන් රු.89,011,899 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 98 ක ප්‍රතිශතයක් විය.

(ඇ) ව්‍යාපෘති අංක 2,3 යටතේ වැය විෂයයන් තුනක් සඳහා මූ.රෙ. 66 මඟින් මාරුකර තිබුණු එකතුව රු.3,500,000 ක් වටිනා ප්‍රතිපාදන වලින් එකතුව රු.2,269,319 ක් හෙවත් සියයට 65 ක් ඉතිරි වී තිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

2025 වර්ෂයේ ජනවාරි මස පියවා තිබුණු සමාලෝචිත වර්ෂයට අදාළ ගෙවිය යුතු ශේෂ 10 ක එකතුව රු.1,120,904 ක් බැරකම් ලෙස හඳුනාගෙන ගිණුමෙහි අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 මාර්තු 25 දිනැති අංක 01/2018 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ වක්‍රලේඛයේ 1.2.1 ඡේදය	කුරුණෑගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 20 ක රජයේ ඉඩම් අනවසර අල්ලාගැනීම් පිලිබඳ ආ.ඒ.ආ.160 ආකෘතිය ප්‍රකාර දෙසති වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.
(ආ) 2020 සැප්තැම්බර් 18 දිනැති අංක 16/2020 දරන අභ්‍යන්තර ආරක්ෂණ, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ වක්‍රලේඛයේ 10 ඡේදය	ප්‍රාදේශිය ලේකම්, සහකාර ප්‍රාදේශිය ලේකම් සහ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් සුදුසු පරිදි බෙදා වෙන් කරගෙන අවම වශයෙන් මාස 04 කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු කළ යුතු බවට උපදෙස් දී ඇතත්, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 20 ක ග්‍රාම නිලධාරී කාර්යාල පරීක්ෂාව වක්‍රලේඛය ප්‍රකාරව සිදු කර නොතිබුණි.
(ඇ) 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද කාර්ය පටිපාටික රීති 01 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 251 වගන්තිය	එකම සේවා ස්ථානයේ වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් කළයුතු වුවද, ප්‍රාදේශිය ලේකම් කාර්යාල 26 ක 2024 දෙසැම්බර් 31 දිනවන විට වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කල ඒකාබද්ධ සේවා නිලධාරීන් 222 ක්, ග්‍රාම නිලධාරී 72 ක් හා සංවර්ධන නිලධාරීන් 338 ක් සම්බන්ධයෙන් ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4 කැන්පතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 30 හි කැන්පත් ගිණුම් 6 කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.328,405,434 ක ශේෂයක් පැවතුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් අංක 6000-0-0-16-0-42 යටතේ වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු.2,313,584 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු නොකර වසර 2 සිට 5 කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ආ) ගිණුම් අංක 6000-0–0-13-0-60 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගෙන ඇති රු. 2,268,659 ක තැන්පතු මුදල් අදාළ පාර්ශව වෙත නොගෙවා වසර 2 සිට වසර 5 දක්වා කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම පරීක්ෂාවේදී, පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතන අංශයේ හා ගිණුම් අංශයේ කටයුතු පමණක් ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඉංජිනේරු අංශය හා සැලසුම් අංශය ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත ක්‍රියාකාරකම් (Activities) වල ප්‍රතිදාන (Output) සංඛ්‍යාත්මකව නිශ්චිතව දක්වා නොතිබුණි.

(ඇ) කාර්යසාධන වාර්තාවේ 4.0 පරිච්ඡේදයේ, ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව කාර්යසාධන දර්ශක ඉදිරිපත් කළයුතු බව දක්වා තිබුණද, ක්‍රියාකාරී සැලැස්ම තුළ ආයතනයේ කාර්ය සාධන දර්ශක ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තාවේ 4 පරිච්ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ දී ග්‍රාමීය විදුලි රැහැන් සහිත විදුලි දිගු ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය ජල සැපයුම් හා නිල සෙවන කාර්යාල ඉදිකිරීම යන අංශ 3 සඳහා කිසිදු සංවර්ධන යෝජනාවක් ක්‍රියාවට නංවා නොතිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද අඹන්පොල ජල ව්‍යාපෘතිය, 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද අංක 425 කටුපොත සහ අංක 406 කටුපොත යුනිට් 03 ජල යෝජනා ක්‍රම හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙල්ගාල දිවා රාත්‍රී ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු සඳහා පිලිවෙලින් රු.3,774,418 ක් රු.3,854,128 ක් හා රු.947,746 ක වියදමක් දරා තිබුණද, එම ව්‍යාපෘති සම්පූර්ණයෙන් නිම කර ජනතාවගේ භාවිතය සඳහා ලබාදීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) පඬුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විජය උදාගම මස්වෙලඳාම පවත්වාගෙන යන ව්‍යාපාරිකයෙකුට 2022 ගම සමඟ පිලිසඳර ව්‍යාපෘතිය යටතේ රු.97,000 ක වියදමක් දරමින් කඩ කාමරයක් ඉදිකර දීමට කටයුතු කර තිබුණද, සමාලෝචිත වර්ෂය වන විට එම ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 02 කට අධික කාලයක් ගත වී ඇතත් ඉදිකිරීම් කටයුතු අවසන් කර වෙලඳාම් කටයුතු කරගෙන යාමට අදාළ ව්‍යාපාරිකයා වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.483,582 ක වියදමක් දරමින් අමාදහර ජල සමිතියේ පොම්පාගාරය හා මෝටරය අලුත්වැඩියා කිරීම සහ විදුලිය ලබාගැනීම යන කටයුතු සිදුකර තිබුණද, අළුත්වැඩියාකරන ලද මෝටරය සවිකර ජලටැංකිය තබා පොම්පාගාරය වෙතට ජලය ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2019 වර්ෂයේ ගම්පෙරලිය වැඩසටහන යටතේ කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ රු.867,014 ක වියදමින් ඉදිකර ඇති වොලිබෝල් ක්‍රීඩා පිටිය හා 2021 ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය සඳහා ලද රු.1,470,000 ක මුදල හා ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවෙන් ලද රු.1,016,047 ක මුදල යොදා එකතුව රු.2,486,047 ක් වැය කරමින් ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ ඉදිකළ ක්‍රීඩාපිටිය භාවිතයකින් තොරව පැවතුණි.

(ඇ) 2021 වර්ෂයේ සම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඒකාබද්ධ වැඩසටහන යටතේ ගනේවත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සී/ස තිත්තවැල්ල මැටි කාර්මික ග්‍රාමීය සංවර්ධන සමුපාකාර සමිතිය වෙත රු.4,698,496 ක් වැය කර අලුත්වැඩියාකර දී තිබුණු පොදු පහසුකම් මධ්‍යස්ථානය හා ලබා දී තිබුණු උපකරණ භාවිතයකින් තොරව පැවතුණි.

(ඈ) 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ වටාපත් ආශ්‍රිත කර්මාන්තය සඳහා අලවිව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 06 දෙනෙකුට ලබාදී තිබූ රු.215,400 ක් වටිනා මහන මැෂින් 06 ක් අවශ්‍යතාවයට නොගැලපීම හේතුවෙන් භාවිතයකින් තොරව පැවතුණි.

(ඉ) 2019 දෙසැම්බර් 30 දින රු.760,707 ක වියදමක් දරමින් වැඩ නිමකර තිබුණු ප්‍රජා මූලික හරිත සමාජ මඟින් පවිත්‍ර හරිත සහ තිරසර පරිසරයක් ඇති කිරීමේ වැඩසටහන යටතේ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ මගී ජනතාවගේ මානසික සුවතාව ඇති කිරීම සඳහා ඉදිකර තිබුණු හරිත නිවස සමාලෝචිත වර්ෂයේදී ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ඊ) 2014 වර්ෂයේ රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඩිගාව යාය 03 වසමේ ඉදිකර ඇති මහජන පුස්තකාල ගොඩනැගිල්ලෙහි වැඩ අවසන් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.391,875 ක වියදමක් දරා තිබුණද, එම ගොඩනැගිල්ල භාවිතයකින් තොරව පැවතීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(උ) 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මල්ලවපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන වැඩසටහන සඳහා රු.1,256,563 ක් වැයකර බීජ වෙන්කිරීමේ යන්ත්‍රයක්, ගම්මිරිස් සුදු කිරීමේ යන්ත්‍රයක්,බීජ වියළීමේ යන්ත්‍රයක් ලබා දී තිබුණද, වසර 3 ක් පුරා මෙම වත්කම් නිසි පරිදි උපයෝජනය කර නොතිබුණි. එසේ තිබියදී 2023 වර්ෂයේ තවදුරටත් රු.126,562 ක වියදමක් දරමින් තුනපහ අඹරන මැෂිමක්, තරාදියක් හා සීලර් යන්ත්‍රයක්ද ලබා දී තිබුණද, නිසි පරිදි වත්කම් උපයෝජනය නොවීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ දෙල් වගාව ප්‍රවලිත කිරීම හා අලෙවිය පිලිබඳ නියමු ව්‍යාපෘතිය වෙනුවෙන් 2023 වර්ෂයේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඔල්ගමුව ග්‍රාම නිලධාරී වසමේ ප්‍රතිලාභියෙකු වෙත ලබාදුන් රු.324,500 ක් වටිනා ඉලෙක්ට්‍රෝනික තරාදියක්, සුළු පරිමාණ විජලන යන්ත්‍රයක්, පොලිතීන් සීලරයක් හා මධ්‍යම ප්‍රමාණයේ පිටිකොටන යන්ත්‍ර භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ බමුණාකොටුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කර තිබුණු ජල නල දීර්ඝ කිරීමේ ව්‍යාපෘති 02 ක් සඳහා රු.14,373,885 ක මුදලක් ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය වෙත ගෙවා සමාලෝචිත වර්ෂයට වර්ෂ 10 කට අධික කාලයක් ගත වී තිබුණද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ජලය ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

(ආ) සමෘද්ධි/ අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 2 ක් සවිබල ගැන්වීමේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන 2021 රජයේ දායකත්වය යටතේ රු. 956,500 ක් වටිනා උපකරණ හා භාණ්ඩ ලබාදී තිබුණු ප්‍රතිලාභීන් 21 දෙනෙකු ව්‍යාපෘතියෙන් ඉවත් වී තිබීමෙන් මෙම වැඩසටහනෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොමැති අතර අදාළ උපකරණ වෙනත් ප්‍රතිලාභියෙකු වෙත ලබා දීමටද, කටයුතු කර නොතිබුණි.

4.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය වැඩසටහන හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 647,061 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයට ගෙවා පානීය ජල මාර්ග ව්‍යාපෘති 04 ක වැඩ 2024 ජූලි 26 දින අවසන් කර තිබුණද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක තත්වයේ නොතිබුණි.

4.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව කාර්ය සාධන වාර්තාව මුල්‍ය ප්‍රකාශන සමඟ 2025 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම කාර්යසාධන වාර්තාව පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කාර්යසාධන වාර්තාව ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සකසා නොතිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගත වූ කාර්යයන් කාර්යසාධන වාර්තාව තුළින් නිරූපණය නොවුණි.

(ආ) කාර්යසාධන වාර්තාවේ 3.8 ඡේදය ප්‍රකාරව, 2024 දෙසැම්බර් 31 දිනට කේන්ත තුනකට අදාළව පමණක් වත්කම් දක්වා තිබුණු අතර, ඉතිරි කේන්ත හතරට අදාළ වත්කම් නොමැති

බව දක්වා තිබුණු නමුත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල බදු දෙන ලද වත්කම් පවතින බැවින් එම වත්කම් කේත අංක 9180 යටතේ නිරූපණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 12.2 ඡේදයේ දැක්වෙන වාර්ෂික කාර්ය සාධන වාර්තා සැකසීම සඳහා වූ මාර්ගෝපදේශ අංක 14 හි 3.8 ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 2024 වාර්ෂික කාර්ය සාධන වාර්තාව සමඟ ඉදිරිපත් කර තිබුණද, එහි වත්කම් කේත අංක 9151 සිට 9154 දක්වාත්, 9160 හා 9180 ට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට හාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය දක්වා නොතිබුණි.

4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

4.2.1 විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024

මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අංක MF/02/2023 හා 2023 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට රු. මිලියන 860 ක් වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට හඳුනාගන්නා ලද රු. 819,076,546 ක් වටිනා අනුමත ව්‍යාපෘති 4942 න්, රු. 213,139,500 ක් වටිනා ව්‍යාපෘති 3421 ක්ම හාණ්ඩ මිලදී ගෙන බෙදාහැරීමේ ව්‍යාපෘති වන අතර මෙය මුළු ව්‍යාපෘති වටිනාකමින් සියයට 26 ක් විය. මෙම අත්‍යවශ්‍ය නොවූ ව්‍යාපෘති වෙනුවෙන් මුදල් වැයකිරීම නිශ්ඵල මෙන්ම වැය කළ මුදලට සරිලන ප්‍රාග්ධන වත්කම් රට තුළ බිහි නොවීමට හේතුවක්වී තිබුණි.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පැල්පත් නිවාසවල ජීවත් වන පවුල් 1994 ක්ද, විදුලිය නොමැති නිවාස 3591 ක්ද, නිවාස නොමැති පවුල් 3404 ක්ද, වැසිකිළි පහසුකම් නොමැති නිවාස 5854 ක්ද, පවතිද්දී එවැනි ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය අවම මට්ටමක පැවතීම තුළින් උක්ත චක්‍රලේඛයෙන් අපේක්ෂිත ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් තුළින් ප්‍රාදේශිය විෂමතා අවම කරමින් රට තිරසරව සංවර්ධන කිරීමටත්, සවිමත් ග්‍රාමීය ආර්ථියක් බිහිකිරීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමත් සිදුනොවන බව නිරීක්ෂණය විය.

(ඇ) මහව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.530,018 ක් හා ප්‍රාදේශිය සංවර්ධන වැඩසටහන යටතේ රු. 117,043 ක් ලෙස එකතුව රු. 647,061 ක වියදමක් දරමින් පානීය ජලනල පද්ධතියක් ඉදිකිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට ගෙවීම් කර මාස 6 ට අධික කාලයක් ගතවී ඇතත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඇ) විමධ්‍යගත අයවැය යටතේ මල්ලවපිටිය ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ කෘෂි මාර්ගයක බොරළු ගොනු කිරීම හා ඇතිරීම සඳහා රු.575,159 ක් වැයකර තිබුණද, එම මාර්ගය සේදී යාමට ලක්ව තිබුණු අතර දෙවැනි බෝක්කුව අසල මාර්ග කොටසේ අඩියක පමණ ප්‍රමාණයක් හැර අනෙකුත් මාර්ග දෙපස සම්පූර්ණයෙන්ම බාදනය වී බෝක්කුව පෑදීමට ලක්වී තිබුණි. මාර්ගයේ අවසන් ස්ථානයේ සිට මීටර් 15 ක පමණ මාර්ග කොටසක් දැඩි ලෙස බාදනයට ලක් වී තිබුණි.

4.2.2 ග්‍රාමීය මාර්ග සංවර්ධනය - 2024

ගම හා නගරය යා කරන මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන යටතේ සමාලෝචින වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 147,142,725 ක් වැයකර ව්‍යාපෘති 98 ක් ක්‍රියාවට නංවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 30 තුළම ප්‍රතිපාදන සමානව වෙන් කර මාර්ග ඉදිකිරීමට සැලසුම් කළ යුතු වුවත්, ගිරිබාව, ගල්ගමුව, ඇහැටුවැව, මහව, අඹන්පොල, කොටවෙහෙර, ගනේවත්ත, මාවතගම, මාස්පොත හා කුලියාපිටිය (බටහිර) යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල 10 තුළ කිසිදු මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සැලසුම් කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) මෙම වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කර අනුමත වූ රු. 15,250,000 ක් වටිනා ව්‍යාපෘති 16 ක් වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) බමුණාකොටුව ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ ගන්කිරියාව මහා විද්‍යාල මාර්ගයේ සිට දායකයින් විහාරස්ථානයට පැමිණෙන මීටර් 500 ක් පමණ වන අත්‍යවශ්‍ය ප්‍රවේශ මාර්ගය සංවර්ධනය නොකර ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනේ 3.7 උප වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග තෝරාගැනීමේ නිර්ණායකය මත පදනම්ව රු. 4,457,150 ක වියදමක් දරා දිග මීටර් 208.8 ක් හා පළල මීටර් 2.40 ක් වූ විහාරස්ථානයේ දෙරටුව ආරම්භයේ සිට විහාරස්ථාන ආවාස ගෙය හා බෝධි මළුව දක්වා ඇතුළත මාර්ගය සංවර්ධනය කිරීමට කටයුතු කර තිබුණි.

(ඈ) ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රු.969,811 ක වියදමක් දරා මල්ලවපිටිය ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ ඉදිකල නැලව ස්වර්ණ ජයන්ති මාවත සංවර්ධනය කිරීමේදී ප්‍රමාණපත්‍ර අංක 02 අනුව වර්ග මීටර් 8.25 ක් සඳහා ABC ප්‍රවාහනය හා ගොනුගත කිරීම, ඇතිරීම ජලය යොදා තැලීම සඳහා රු.42,149 ක වියදමක් දරා තිබුණද, භෞතික පරීක්ෂණ අවස්ථාවේ මාර්ගය අසල නිවැසියන් තිදෙනෙකු මාර්ගයට ABC නොයෙදූ බව පැවසීමක්, ලොග් සටහන් ගොනුවේ අන්තර්ගත නොවීමත් හේතුවෙන් එම මාර්ගය සඳහා ABC සඳහා වැයකරන ලද වියදම තහවුරු කර ගැනීමට නොහැකි විය.

4.2.3 ප්‍රාදේශිය සංවර්ධනය - 2024

ප්‍රාදේශිය සංවර්ධනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 30 වෙනුවෙන් රු. 95,070,000 ක ප්‍රතිපාදන වෙන්කර ව්‍යාපෘති 860 ක් ක්‍රියාවට නංවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති අංක MF/02/2023 හා 2023 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයට අනුගතව මෙම ප්‍රතිපාදන මුදල් වැය කලයුතු බව දන්වා ඇතත්, චක්‍රලේඛයේ 2 වන ඡේදය ප්‍රකාරව සංවර්ධනය කළයුතු අංශ 18 න් අංශ 8 ක් සඳහා කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් සැලසුම් කිරීම හෝ ක්‍රියාවට නැංවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) චක්‍රලේඛය අනුව ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රාදේශිය විෂමතා අවම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති තෝරාගත යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ වෙන්කළ මුළු ප්‍රතිපාදන මුදල වූ රු. 95,070,000 ක මුදලින් ප්‍රජා සංවිධාන වෙත භාණ්ඩ බෙදා දීම සඳහා රු. 46,345,000 ක මුදලක් වෙන් කර තිබුණ අතර, එය මුළු ප්‍රතිපාදිත මුදලින් සියයට 49 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඇ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බමුණුගෙදර වසමේ එක්සත් මරණාධාර සමිතිශාලා ගොඩනැගිල්ලට ප්‍රවේශවීම සඳහා ඉදිකර තිබුණු පඩිපෙළට අමතරව රු. 265,164 ක නිම්වැඩ වටිනාකමක් සහිත තවත් පඩිපෙළක් උක්ත ප්‍රතිපාදන යටතේ ඉදිකර තිබුණ අතර, වසමේ අත්‍යවශ්‍ය වෙනත් සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන යෙදීමකින් තොරව මෙවැනි අත්‍යවශ්‍ය නොවන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වැයකර තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 29 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිල ගණන් කැඳවා තෝරාගත් සැපයුම්කරුවෙකු වෙතින් රු. 5,404,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු මල්ටි ෆොපර් යන්ත්‍ර (කැබලි කිරීමේ යන්ත්‍ර) 20 ක් සමාලෝචිත වර්ෂය පුරාම භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2009 ජුනි 12 දිනැති අංක NA/DA/12/27 දරන ලිපිය ප්‍රකාරව සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් තම නිල නිවසෙහි අනිවාර්යයෙන්ම පදිංචි වියයුතු බවට අවධාරණය කර ඇතත්, 2023 හා 2024 වර්ෂය තුල රු.1,596,749 ක වියදමක් දරමින් අළුත්වැඩියා කර තිබූ වාරියපොල ප්‍රාදේශිය ලේකම් නිල

නිවස 2024 දෙසැම්බර් 31 දින වන විටත් පදිංචිය සඳහා යොදාගෙන නොතිබුණු බැවින් නිල නිවස පිහිටි ඉඩම වල් බිහිවී තිබුණු අතර, ළිඳ භාවිතයට නොගැනීම හේතුවෙන් විනාශ වීමට ලක්ව තිබුණි.

(ඇ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක පවරා ගැනීමේ කටයුතු සඳහා වර්ෂ 10 සිට වර්ෂ 61 ක කාලයක් ගත වී තිබුණද, කාර්යාලය පිහිටි ඉඩම් කොටස සමාලෝචිත වර්ෂය අවසන් වන විටද, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීමේ කටයුතු අවසන්ව නොතිබුණි.

(ඈ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 09 ක වාහන 23 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ඌන උපයෝජිතව පැවතුණි.

(ඉ) 2020 පෙබරවාරි 05 දින ලියාපදිංචි අයිතිය අවලංගු නොකර ඩබල් කැබ් රථයක් සහ යතුරුපැදි 6 ක් ලංසු කැඳවා විකුණා තිබුණු අතර 2021 දෙසැම්බර් 03 දින ලියාපදිංචි අයිතිය අහෝසිකර යතුරුපැදි 04 ක් වයඹ තාක්ෂණ විද්‍යාලය වෙත ලබාදී තිබුණද, එම වාහනවල ලියාපදිංචි අයිතිය වාර්තාවේ දින වන විටත් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙතම පැවතුණි.

(ඊ) කුරුණෑගල නගර සීමාව තුළ පිහිටි රජයට අයත් වාණිජ වටිනාකමින් ඉහළ ඉඩම් 28 ක් කුරුණෑගල මහනගර සභාව වෙත පවරා දෙන ලෙස ඉල්ලා තිබුණි. මෙම ඉඩම් රජය විසින් දීර්ඝ කාලීන බදු පදනම මත නගර සභාව වෙත ලබා දී රජයට විශාල ආදායමක් උපයාගත හැකිව තිබියදී කුරුණෑගල මහනගර සභාව වෙත පැවරීමට කටයුතු කරමින් පැවතුණි. එම ඉඩම් අතර කුරුණෑගල බස්රථ නැවතුම්පල, මාලිගාපිටිය, මහජන පොල, සුසාන භූමිය, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල ඉඩම, රජපිහිල්ල තානායම, රජපිහිල්ල උද්‍යානය, මහනගර සහා පරිශ්‍රය පිහිටි ඉඩම, මැගසින් හිල් ඉඩම ආදි වාණිජ වටිනාකමින් අධික ඉඩම් පැවතුණි.

(උ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ 13 ක, ග්‍රාම නිලධාරී වසම් 64 ක පිහිටි හෙක්ටයාර් 60.19 ක් වූ ඉඩම් හා එහි පිහිටි ගොඩනැගිලි භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

4.4 පාඩු හා හානි

උඩුබද්දාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ රු.114,650 ක හානි වටිනාකමක් සහිත වාහන අනතුරට සහ අලව්ව හා වීරඹුගෙදර ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 හි හානි වටිනාකම හඳුනා නොගත් වාහන අනතුරු 02 කට අදාළව මු.රෙ. 104(3) ප්‍රාරම්භක වාර්තා හා අවසන් වාර්තා ඉදිරිපත් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් හානිපාඩු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 අනාර්ථික ගනුදෙනු

ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 472 පොතුවිල ග්‍රාම නිලධාරී වසමේ මහගල්මඩ එගොඩ නැමති ගමෙහි පිහිටි හා අ.ග.පි.1302 වැනි පිඹුරේ 06 වැනි බිම් කට්ටිය වශයෙන් දක්වා ඇති හෙක්ටයාර 30.704 ක්(අක්කර 75) භූමිය වසර 30 ක් සඳහා 1999 ජනවාරි 18 දින සීමා සහිත (ජනතා) හිරියාල ගොවි සමාගම වෙත භාර දී තිබුණි. මෙහිදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජාතික සවිය ගම නැඟුම ව්‍යාපෘතිය යටතේ රු.17,383,481 ක් වටිනා මුදල්, යන්ත්‍ර හා උපකරණද, ආයෝජන මණ්ඩලය විසින් පවරා දී ඇති රු.555,618,000 ක් වටිනා ගොඩනැගිලි හා යටිතල පහසුකම්ද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට රු. 37,621,110 ක මුදලක්ද, කෘෂිකාර්මික චක්‍රීය ණය ලෙස රු.3,000,000 ක් ද, ලෙස එකතුව රු.113,622,597 ක් වටිනා දේපළ හා උපකරණ මෙම සමාගමට, සහල් හා පිටි නිෂ්පාදන, බීජ වී සැකසීම, එළවළු පලතුරු විපලනය හා වී මිලදී ගැනීමේ ගබඩා පහසුකම් සහිත කෘෂි නිෂ්පාදන සැකසීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ලබාදුන්නද, වර්තමානයේ මෙකී කිසිදු අරමුණක් ඉටුවී නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් විසින් කෘෂිකාර්මික චක්‍රීය ණය අරමුදලින් ලබාදුන් රු.3,000,000 ක ණය මුදලෙහි 2024 දෙසැම්බර් 31 දිනට තවදුරටත් රු.1,975,000 ණය ශේෂයක් අයවීමට තිබුණි.

(ඇ) රජයේ ඉඩම් ආඥා පනතේ 454 අධිකාරිය අනුව බදු ගිවිසුමේ 9 වගන්තිය හා 10 වන වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම්ගේ හා ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අවසරයකින් කොරව අතුරු බදු දීමක් හෝ උප බදු දීමක් සිදු කල නොහැකි වුවත්, 2022 මැයි 22 දින සිට 2026 අගෝස්තු 31 දින දක්වා වසර 5 ක කාලයකට පලමු හා දෙවන වර්ෂ වලදී මාසිකව රු. 400,000 ක් බැගින්ද, තුන්වන හා හතර වන වර්ෂ වලදී රු. 420,000 බැගින්ද, පස්වන වසරේදී රු.540,000 බැගින් අය කිරීමේ කොන්දේසිය මත වයඹ රයිගම් සිරියල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම වෙත අතුරු බදු ලබාදීම හේතුවෙන් රජයට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

(ඈ) මෙකී සීමා සහිත (ජනතා) හිරියාල සමාගම විසින් ඔවුන්ගේ බදු අයිතිය උකසට තබා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් අවස්ථා 4 කදී රු.27,844,800 ක ණය මුදලක් ලබා ගෙන තිබුණි. මෙම ණය මුදල නොගෙවීම මත දඩ මුදල හා පොලිය ලෙස රු.68,866,556 ක මුදලක් බැංකුව වෙත ගෙවීමට දෙපාර්ශවය 2022 දෙසැම්බර් 29 දින එකඟ වී තිබුණද, එම එකඟතාවයට අනුව කටයුතු කර නොතිබුණ අතර මෙම සීමා සහිත (ජනතා) හිරියාල සමාගම දිගින් දිගටම අලාභ ලබමින් පසුවන තත්වයක මෙම වටිනා ඉඩම් හා

රු.113,622,597 ක් වටිනා උපකරණ හා දේපළ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත සින්න වීමේ අවධානමක් පැවතියද, මේ සම්බන්ධව බලධාරීන් විසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.6 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල රජයේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ගොඩනැගිලි ඉදිකර ඇති රජයේ ඉඩම්වල අයිතිය එම ආයතන වෙත පවරාදෙන ලෙස ඉල්ලුම් කර වර්ෂ 8 සිට වර්ෂ 14 ක් දක්වා කාලයක් ඉක්මවා ගොස් ඇතත්, එම ඉඩම් පවරා දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2018 මාර්තු 25 දිනැති අංක 01/2018 දරන චක්‍රලේඛයේ 1.2.1 ඡේදය ප්‍රකාරව රජයේ ඉඩම් අනවසර අල්ලාගැනීම් පිළිබඳ ආ.ඒ.ආ.160 ආකෘතිය පරිදි ඉදිරිපත් කර තිබුණ වාර්තා අනුව, වාර්තා වූ අනවසර අල්ලාගැනීම් සිද්ධි 16 ක් සඳහා විගණිත දිනය වන විටත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 ක් විසින් අස්කිරීමේ නිවේදන නිකුත් කිරීමට, නඩු පැවරීමට හෝ භුක්තිය ආපසු භාරගැනීමට යන ක්‍රියාමාර්ග වලට එළඹ නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට බිංගිරිය හා කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් රජයේ ඉඩම් 16 ක් නොයෙකුත් සංවර්ධන කාර්යන් සඳහා අත්පත් කරගැනීමේදී වසර 01 මාස 02 සිට වසර 07 මාස 08 දක්වා කාල ප්‍රමාදයන් පැවතුණි.

(ඈ) සෑම රජයේ ආයතනයක් විසින්ම ස්වකීය ඉඩම් දේපළ වල නම, පිහිටීම, වටිනාකම ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කළ යුතු නමුත්, එවැනි ලේඛනයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව නොතිබීම හේතුවෙන් කුරුණෑගල නගරය අවට වසම් 04 ක බිම් ප්‍රදේශ වසර ගණනාවක් තිස්සේ අනවසර ඉදිකිරීම් වලට ගොදුරු වී ඇති බව නිරීක්ෂණය වූ අතර එම ඉඩම් රජයේ ඉඩම් (ඝන්නකය ආපසු ගැනීම) පනත යටතේ කටයුතු කර නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2024 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශිය ලේකම් කාර්යාල දෙකකට අදාළව , මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වසර 1 සිට වසර 20 දක්වා පැරණි රු. 287,984 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

(ඊ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 02 කට අදාළව විශ්‍රාම ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් මාස 5 හා වසර 2 දක්වා පැරණි රු. 316,150 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

(උ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාළව සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.371,686 ක ණය ශේෂයක් අය විය යුතුව පැවතුණි.

(ඌ) නිසි සන්නිවේදන සහ සුදුසු ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 9 ක 2024 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනා මුදල් වලින් රු.13,098,200 ක් අධිභාර බවට පත්වී තිබුණි.

(එ) විශ්‍රාමික නිලධාරීන් 725 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවා ඇති රු.167,196,792 ක් වූ විශ්‍රාම වැටුපෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.105,206,932 ක මුදලක් අයකරගෙන තිබුණු අතර තවදුරටත් රු. 84,576,516 ක මුදලක් අයකරගත යුතුව පැවතුණි.

(ඒ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 12 ක විශ්‍රාමිකයන් 16 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවන ලද, එහෙත් විශ්‍රාම වැටුප් නැවත අයකරගැනීමට පෙර එම විශ්‍රාමිකයින් මියයාම නිසා 2024 දෙසැම්බර් 31 දින වන විට අයකරගත නොහැකිව පවතින විශ්‍රාම වැටුප් ශේෂය රු.3,217,115 ක් වූ අතර මෙම මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීම සඳහා 2025 අප්‍රේල් 20 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඔ) රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2024 මාර්තු 30 දිනැති අංක 06/2024(i) හා 2024 ජූලි 17 දිනැති අංක 06/2024(ii) දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව අස්වැසුම් වැඩසටහන, විමධ්‍යගත අරමුදල සහ අදාළ වන පරිදි කඳුකර දශකය, කෘෂි නව්‍යකරණ වැඩසටහන යනාදී අනෙකුත් සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් රු.15,000 ක දිරි දීමනාව සමාලෝචිත වර්ෂය තුළ අනුමත නිලධාරීන් විසින් ලබා ගනිමින් සිටියදී, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් 2014 ජනවාරි 21 දින නිකුත් කරන ලද අංක EST/8ALLOW/03/121 ලිපියේ 02 ඡේදය ප්‍රකාරව ග්‍රාමීය මට්ටමේ සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් සම්බන්ධීකරණය කරමින් අධීක්ෂණය කිරීම වෙනුවෙන් 2024 මාර්තු සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව දීමනාව ලෙස එකතුව රු.1,376 ,919 ක් නිලධාරීන් 30 දෙනෙකු විසින් ලබාගෙන තිබුණි.

(ඕ) කුරුණෑගල නගරය අවට ඇති කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටි බිම් ප්‍රදේශ 04 ක් අනවසරකරුවන් 14 දෙනෙකු විසින් වසර ගණනාවක් තිස්සේ අනවසර ඉදිකිරීම් වලට යොදාගෙන තිබුණු අතර රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීම) පනත යටතේ කටයුතු කර ඉඩම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5 තිරසාර සංවර්ධනය

තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු 17 ක් ලඟාකර ගැනීමේ අරමුණින් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රමවත් උපාය මාර්ගික සැලැස්මක් සකසා නොතිබුණු අතර එක් එක් වර්ෂ තුළදී අංශ විසින් ලබාදෙන කාර්යසාධන වාර්තා පදනම් කරගනිමින් තිරසර සංවර්ධන කාර්යසාධන සැලැස්මක් සකසා තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	136	123	13	-
තෘතීයික මට්ටම	73	70	03	-
ද්විතියික මට්ටම	4,936	5,022	-	86
ප්‍රාථමික මට්ටම	291	275	16	-
එකතුව	5436	5490	32	86

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක් ද තෘතීයික මට්ටමේ තනතුරු 3 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 16 ක් ද වශයෙන් මුළු තනතුරු 32 ක් පුරප්පාඩුව පැවති අතර ද්විතියික මට්ටමේ සේවකයින් 86 ක් අතිරික්තව පැවතුණි. පුරප්පාඩු පුරවා ගැනීමටත් අතිරික්ත සේවකයින් පුප්පාඩු පවතින ස්ථානවලට යොමු කිරීමටත් කටයුතු කර නොතිබුණි.

ආර්. පී. ටී. ඩී. රාජපක්ෂ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

ආර්.පී.ටී.ඩී. රාජපක්ෂ

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

4.0 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	අංශය/සංරචකය	අපේක්ෂිත නිමවුමේ (%) ලෙස තත්‍ය නිමැවුම			
		0%-49%	50%-74%	75%-89%	100%-90%
1	ප්‍රවේශ මාර්ග (ජාතික/පළාත්/පාලන/ග්‍රාමීය මාර්ග)	-	-	-	√
2	ග්‍රාමීය විදුලිය (රැහැන් සහිත විදුලි දිගු)	-	-	-	-
3	සනීපාරක්ෂක පහසුකම්	-	-	-	√
4	ක්‍රීඩා පිටි	-	-	-	√
5	සුළු වාරිමාර්ග	-	-	-	√
6	ග්‍රාමීය ආර්ථිකය (සතිපොළ/අලෙවි මධ්‍යස්ථානය/ස්වයං රැකියා)		-	-	√
7	ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය	-	-	√	-
8	සමාජ සුභ සාධනය (අධ්‍යාපන/සෞඛ්‍ය /ප්‍රජා ශාලා)	-	-	-	√
9	නිවාස සංවර්ධනය	-	-	-	√
10	සුරිය පැනල/විදුලිය (නිවාස ඒකක සඳහා)	-	-	-	-
11	ග්‍රාමීය ජල සැපයුම්	-	-	-	-
12	නිල සෙවන	-	-	-	-
13	වෙනත්	-	-	-	√

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

අරමුණු අංකය	අරමුණු	ඉලක්ක අංකය	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
					0%-49%	50%-74%	75%-100%
1	සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	1.2.	ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූලවන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවයන්ගේ පෙළෙන සියලුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින්,කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩුකිරීම.	1.2.1			100
				1.2.2			100
		1.3	පහළ මට්ටමේ අයද ඇතුලත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම හා 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය වී තිබීම.	1.3.1			100
		1.අ	විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා සියලුම ආකාරයේ දරිද්‍රතාවන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා වැඩි දියුණු කරන ලද සංවර්ධන සහයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මගින් සම්පත් ලබාදීම කැපීපෙනෙන ආකාරයෙන් වර්ධනය කිරීම.	1.අ.1			100
				1.අ.2			87.4
				1.අ.3			98.61
		1.ආ	දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරුද්‍රතාවයෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම.	1.ආ.1			100

2	සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.	2.1	2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.	2.1.1			98
		2.2	අවුරුදු 5ට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටි වීම සහ ක්ෂය වීම පිළිබඳ අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්ක 2025 වන විට ලඟාකර ගැනීම ද ඇතුළත්ව 2030 වන විට සියලුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්ත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහැනු ළමුන්ගේ, ගැබිනි මාතාවන්ගේ, කිරි දෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට විසඳුම් ලබා දීම.	2.2.2			100
		2.3	2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ ගොවි පවුල් හා ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායීතාව සහ ආදායම ඉඩම්වලට ආරක්ෂාකාරීම සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන් , දැනුම, මූල්‍ය සේවා, වෙළෙඳපොල සහ වටිනාකම් එකතු කිරීම සහ ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මඟින් දෙගුණ කිරීම.	2.3.1		72.6	
				2.3.2			100
		2.4	2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ කාළගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාළගුණික තත්ත්වයන්, නියහ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.	2.4.1		72	

	ෙ	2.අ	විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල් ඇතුළුව දියුණු වෙමින් පවත්නා රටවල කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා ඉහළ නංවන ලද අන්තර්ජාතික සහයෝගිතාවයෙන් ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන්, තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදුකරන ආයෝජන වැඩිකිරීම.	2.ආ.2			100
3	නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම	3.3	2030 වන විට ඒඩ්ස්,ක්ෂය රෝගය,මැලේරියා ඇතුළු නොතකා හැර ඇති සර්ම කලාපීය වසංගත,හෙපටයිටිස්,ජලය මඟින් ඇතිවන රෝග සහ අනෙකුත් බෝවන රෝග තුරන් කිරීම.	3.3.1			100
		3.4	2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මඟින් හා වලක්වා ගැනීමේ ක්‍රම මඟින් 1/3කින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	3.4.1			100
		3.6	2030 වන විට මහාමාර්ගවල සිදුවන අනතුරුවලින් සිදුවන තුවාලවීම් සහ මරණ සංඛ්‍යාව අඩුවීම.	3.6.1			100
		3.8	මූලික්‍යමය අවධානයට පත්වීම සඳහා ආරක්ෂණයද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ හා අඩු වියදමකින් ලබා ගත හැකි ඖෂධ,එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලු දෙනාටම ලබා ගත හැකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම.	3.8.1			81.5
		3.9	2030 වන විට රසායනික වාතය ජලය හා පස දූෂණය වීමත්,අපිරිසිදු වීමත් නිසා ඇතිවන මරණ සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.	3.9.2			100
4	පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	4.1	2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන ආකාරයේ සියලුම ගැහැනු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීය අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම.	4.1.1			87.93

		4.2	2030 වන විට සියළුම ගැහැනු ළමුන්ට හා පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශවීමේ අවස්ථාව පැවතීම හා එමඟින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සුදානම්ව සිටින බව තහවුරු කිරීම	4.2.1			100
